" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අැප කැපවෙමු "

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுவான தொலைபேசி / General Telephone - 011 - 2093000

ISO 9001 | SLAB ACCREDITED | ISO/IEC: 17021 QMS-001-01

129

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01-2022

ඔබේ අංකය / உமது இலக்கம் / Your No.

දිනය / திகதி / Date 2022.06. 27

ආණ්ඩුකාර ලේකම්,

ආණ්ඩුකාරවර කාර්යාලය,

බස්නාහිර පළාත.

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම**

උක්ත කරුණට අදාලව රජයේ කාර්යාල වෙත නිලධරයන් කැඳවීම සීමා කිරීම මැයෙන් 2022.06.26 දිනැතිව නිකුත් කරන ලද 16/2022(1) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පවතින ආකාරයෙන්ම පළාත් රාජ්‍ය සේවයට අදාල කර ගැනීම සුදුසු බව මවිසින් නිර්දේශ කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා මේ සමග කාරුණිකව ඉදිරිපත් කරමි.

ඩබ්.එම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන).

o/c
06/27

අත් කලේ :- ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 16/2022(I)

මගේ අංකය: EST-6/03/LEA/1060
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2022.06. 26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රජයේ කාර්යාල වෙත නිලධරයන් කැඳවීම සීමා කිරීම

ඉහත කරුණට අදාළව 2022.06.17 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2022 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එදිනෙදා ප්‍රවාහන පහසුකම් සලසා ගැනීමේදී මහජනතාව මුහුණ පා සිටින ගැටලුකාරී තත්ත්වය සැලකිල්ලට ගෙන, අත්‍යවශ්‍ය සේවාවන්වලට වඩා වැඩි ඉඩක් ලබාදීම වෙනුවෙන්, නැවත දැනුම් දෙන තුරු, උක්ත චක්‍රලේඛය අනුව අමාත්‍යාංශ ලේකම්වරුන්/පළාත් ප්‍රධාන ලේකම්වරුන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ආයතන ප්‍රධානීන් විසින් නිලධරයන් සේවා ස්ථාන වෙත කැඳවීම සම්බන්ධයෙන් තීරණය කිරීමේ දී ආයතනයේ එදිනෙදා රාජකාරි කටයුතු බිඳ වැටීමකින් තොරව පවත්වා ගෙන යාමට අත්‍යවශ්‍ය අවම කාර්ය මණ්ඩලය පමණක් සේවා ස්ථානය වෙත කැඳවීමටත්, හැකි සෑම අවස්ථාවක දී ම නිලධරයන්ට නිවසේ රැඳී සිටීමට ඉඩ දී ඔවුන්ගේ සේවය මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබා ගැනීමටත් ප්‍රමුඛතාව ලබා දී කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

03. මහජනතාව සමග සෘජුවම ගණුදෙනු කරන ආයතන වෙත නිලධරයන් කැඳවීම සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීම අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ/ පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ උපදෙස් සහ සමීප අධීක්ෂණය ඇතිව සිදු කිරීමට අදාළ ආයතන ප්‍රධානීන්/ප්‍රාදේශීය ප්‍රධානීන් වග බලා ගත යුතුය.

04. මේ අනුව, මෙම කාලය තුළ උපරිමයෙන් ඉන්ධන පිරිමසා ගත හැකි ආකාරයට නිලධරයන්ගේ ගමන් බිමන් සීමා කළ යුතු අතර සියලුම රැස්වීම් සහ සාකච්ඡා මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වීමට ද කටයුතු කළ යුතුය.

05. තවද, රජයේ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගෙන යාමට මෙයින් බාධාවක් නොවිය යුතු ය.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය